# 03

# කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍යවලින් හෙළිවන සමකාලීන කාන්තාවගේ සමාජ තත්ත්වය පිළිබඳ විමර්ශනයක්

*ඒ.ඩබ්.ජී.එන්.කේ. ජයතිලක*[1]


## Abstract

***Sri Lanka has renowned writing tradition from time immemorial. Specially, the Kotte period was prominent for literary works in written to a Sandesha Kawya the most famous among the litreture endeviors in this ear. Hansa, Paravi, Selalihini, Gira and Kokila Sandesha are the written in Kotte period.***

***Sandesha Kawya starts with the offerring of bless and praising on the massager followed by a brief indication of the route. This Shandesha poems describe about towns, cities and their special features, landsmarks, importent events, people, beauty of women's and animals that across on it's way to the distination. When study thise Sandesha Kawya provide historical information in releven to the political, economoics, social and religious conditions of the Kotte era. This paper will examine the social statas women who live in the Kotte period. The research is bassed on historical research methodology.***


## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සාහිත්‍ය සම්ප්‍රදාය අනුරාධපුර යුගයේ සිට විකාශනය වී ගද්‍ය හා පද්‍ය යන දෙයාකාරයකින් විද්‍යමාන වේ. සිය කාව්‍ය නිර්මාණ තුළින් බුදුගුණ වර්ණනා කිරීම හෝ සමාජයට කිසියම් ධර්මෝපදේශයක් දීම ඉපැරණි සිංහල කවියාගේ ප්‍රධාන පරමාර්ථය විය. සියබස්ලකර කතුවරයා "පෙදෙන් බුදු සිරිතැ බසින් වත්සිරිත් ඈ" යනුවෙන් බෝසත් සිරිතක් වර්ණනා කිරීම නිර්දේශ කළේ ය. (***සියබස්ලකර විවරණය***, 2002: පද්‍ය, 20.) මේ මග ගමන් කළ සිංහල කවීහු සසදාවත, මුවදෙව්දාවත සහ කව්සිළුමිණ වැනි පද්‍ය කාව්‍ය රචනා කළහ.

ඉපැරණි සිංහල කවියා තුළ පැවති ආගමික පරමාර්ථ ක්‍රමයෙන් වෙනස් මඟකට යොමු වීම සංදේශ කවියාගෙන් සිදුවිය.

---

[1] *ඒ.ඩබ්.ජී.එන්.කේ. ජයතිලක, කථිකාචාර්ය (ආධුනික), මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,* awnkjayathilake@gmail.com

සංදේශ කතුවරුන් බොහෝ දෙනෙකුගේ පරමාර්ථය වූයේ යම් යම් පුද්ගලයින්ගේ ලෞකික අවශ්‍යතා සපුරාලීම සඳහා දෙවියන් යැදීම ය. සැළලිහිණි සන්දේශයෙන් උලකුඩය දේවියට පුත්‍රුවනක් ද පරෙවි සන්දේශයෙන් චන්ද්‍රාවතී දේවියට සුදුසු ස්වාමියෙකු ද ප්‍රාර්ථනා කළේ ය. (***ගිරා සන්දේශය***, 1987: පිපි. 12, 13.) මෙයින් ප්‍රකට වන්නේ සිංහල සන්දේශ කාව්‍ය පහළවීමත් සමඟ සාහිත්‍ය පරමාර්ථ වෙනස් මුහුණුවරක් ගත් අයුරු ය.

'සංදේශය' යනු දූතයෙකු අත කිසියම් තැනැත්තෙකු වෙත යවන පණිවිඩයකි. අස්න යන්න ද මීට පර්යාය ලෙසින් යෙදී ඇත.

"මෙමියුරු පදැති සැළලිහිණිය අස්න යෙදි" (*සැළලිහිණි සන්දේශය*, 1995: පද්‍ය, 111.)
"මෙමියුරු පද රසැති මේ සැවුල් අස්න යෙදි" (*සැවුල් සන්දේශය*, 2005: පද්‍ය, 207.)

එමෙන් ම 'හසුන', 'හස්න' වැනි නම්වලින් ද මෙම කෘති හඳුන්වා ඇත. ''උපුල්වන් දෙවිඳු දැක දෙව් මේ හස්න" ( ***පරෙවි සන්දේශය*** , පද්‍ය, 5). "දෙව් මෙහසුන් විබිසන සුරිඳුට පවර" (***සැළලිහිණි සන්දේශය***, පද්‍ය, 5). උදාහරණයි. සන්දේශ කාව්‍යයන්හි සන්නිවේදන කාරකයා ලෙස තෝරාගෙන ඇත්තේ මනුෂ්‍යයෙකු නොවේ. බොහෝ විට සන්දේශ කාව්‍යවල තෝරා ගත් දූතයා අචේතනික ජංගම අවස්ථාවක් හෝ සචේතනික පක්ෂියෙකු වැනි සතෙකු හෝ බව පෙනේ. 'සන්දේශ' යන වචනය සිංහල පද්‍ය ග්‍රන්ථවල යෙදෙන්නට පටන් ගැනුණේ කෝට්ටේ යුගයේ දී පමණ ය. මේ වචනය පළමුවරට සඳහන් වන්නේ වීදගම හිමියන්ගේ හංස සන්දේශයෙහි ය. එහි එන,

"පසිඳු වනරතන යතිඳුට දෙවන ලෙස
මෙබඳු නමින් සැලසී තිසර සන්දෙස" (*හංස සන්දේශය*, 2009, පි. x.)

යන පද්‍යයෙන් ඒ බව හෙළි වේ.

සිංහල සන්දේශ කාව්‍යකරණය සඳහා කවීන්ට බොහෝ සේ බලපා ඇත්තේ මේඝදූතයට බොහෝ කාලයකට පසුව භාරතයේ බිහි වූ පක්ෂීන් දූත කාර්යයෙහි යොදා ගත් සන්දේශ කාව්‍ය බව පෙනේ. සිංහල සන්දේශ රචනයෙහි දී සංස්කෘත අලංකරණයන් දැක් වූ සන්දේශ කාව්‍ය ලක්ෂණ ද ගුරු කොට ඇත. සන්දේශයක් වශයෙන් මෙරට පළමුවෙන් රචනා වී ඇත්තේ පාලි කෘතියක් වූ පොළොන්නරු යුගයේ ලියවුණු මානාවුළු සන්දේශයයි. එසේ වුව ද සිංහල සාහිත්‍යයෙහි සන්දේශ කාව්‍ය පහළ වූයේ කුමන කාලවකවානුවක දී ද යන්න ස්ථිරව ම කිව නොහැකි ය. දහතුන්වැනි සියවසට පෙර සිංහල සන්දේශ කාව්‍ය ලිය වී තිබූ බව සිදත් සඟරා පුරාණ සන්නයෙහි මයුර සන්දේශය පිළිබඳ එහි දැක්වෙන පහත සඳහන් උධෘතයෙන් පෙනී යයි.

"මොණරිඳු එකල්හි පුල් සගළ නවා ගනී" (*සිදත් සඟරා පුරාණ සන්නය*, 1971: පි. 59.)

මෙහි සඳහන් මයුර සන්දේශය නෂ්ටප්‍රාය වී ඇත. ක්‍රිස්තු වර්ෂ දහතුන්වැනි සියවසට පෙර සිට ම සන්දේශ කාව්‍ය මෙරට සාහිත්‍ය තුළ ලියැ වී තිබුණු බව මින් සනාථ වේ. ඒ අනුව මෙරට සන්දේශ කාව්‍යයේ ආරම්භය දඹදෙණි යුගයටත් පෙර සිට ම පැවති බව පෙනේ. නමුත් සන්දේශ කාව්‍ය වඩාත් ප්‍රචලිත තත්ත්වයට පත්වූයේ කෝට්ටේ සමයේ දී ය. හංස, පරෙවි, සැළලිහිණි,

සැබෑ තොරතුරු හා ඔවුන් පිළිබඳ සමාජයේ පැවති ආකල්ප හෙළි කර ගැනීමට නොහැකි වන්නේ නොවේ. සන්දේශ කාව්‍ය තුළින් කෝට්ටේ යුගයේ සිටි ස්ත්‍රිය පිළිබඳවත් විවිධ සමාජ ස්තරායනවලට හා වෘත්තීන්වලට හිමිකම්කී ස්ත්‍රීන් පිළිබඳවත් මෙන් ම ඔවුන්ට සමාජයේ හිමි වූ තත්ත්වය පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම අගය කළ යුතු වේ. කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය තුළ කාන්තාව පිළිබඳ කරනු ලබන වර්ණනා ඉතා අවධානයෙන් පරීක්ෂා කරන විට එකල සමාජයේ රාජකීය ස්ත්‍රීන්, කුල කතුන්, පුරඟනන්, ගණිකාවන්, ගැමිලියන්, ගෙවිලියන් ආදී වශයෙන් වූ විවිධ කාන්තාවන් සිටි බවට තොරතුරු හමු වේ. මොවුන් අතරින් රාජකීයන් පිළිබඳ ඉදිරිපත් කරන තොරතුරුවල දී පරෙවි හා සැළලිහිණි සන්දේශ කාව්‍යවල සඳහන් තොරතුරුවලට වැදගත් තැනක් හිමි වේ. මේ සන්දේශ කාව්‍ය දෙකින් හයවැනි පරාක්‍රමබාහු රජුට සිටි දියණියන් පිළිබඳ තොරතුරු අනාවරණය වේ. පරෙවි සන්දේශයෙහි සඳවත් හෙවත් චන්ද්‍රාවතී නමින් වූ දියණිය පිළිබඳවත් සැළලිහිණි සන්දේශයෙහි ලෝකනාථා හෙවත් උලකුඩය දේවිය පිළිබඳවත් සඳහන් කර තිබේ. උලකුඩය දේවිය පිළිබඳ මුල් ම තොරතුරු ලැබෙන්නේ සැළලිහිණි සන්දේශයට වසරකට පමණ පෙර විජයබා පිරුවන්පති හිමි හෙවත් සිරි රහල් හිමියන් විසින් කළ කාව්‍යශේඛරයෙනි (තිලකසිරි, 2008: පි. 198).

"මේ නිරිඳුගේ දු ළඳ
උලකුඩය දේවී සඳ
සොමි ගුණෙනි පුන් සඳ
පවති සිරසඳ සිරිත් ඇම සඳ" (*කාව්‍යශේඛරය*, 2006: පද්‍ය, 14).

යනුවෙන් එහි දී උන්වහන්සේ උලකුඩය දේවිය හඳුන්වා දී ඇත. එමෙන් ම උන්වහන්සේ උලකුඩය දේවිය සතු සුවිශේෂී ගුණාංගයන් පිළිබඳව ද වර්ණනා කර තිබේ. සැළලිහිණි සන්දේශය තුළින් ද උලකුඩය දේවියගේ ගුණ නුවණ පිළිබඳ වර්ණනා කර තිබේ. (***සැලලිහිණි සන්දේශය පුරාණ සන්නය සහ අර්ථ ප්‍රදීපිකා***, 1999: පද්‍ය, 99-102). හයවැනි පරාක්‍රමබාහු රජුගේ දියණියන් පිළිබඳ යම් විනිශ්චයකට එළඹීමට මෙම තොරතුරු උපයෝගී කර ගත හැකිය. අතිශයෝක්තියෙන් ඔවුන් පිළිබඳ සඳහන් කර තිබුණ ද විශේෂයෙන් උලකුඩය දේවියගේ චරිත ලක්ෂණ වූ බුදුදහම කෙරෙහි පැවති භක්තිය, තෙරුවන් කෙරෙහි වූ පැහැදීම, පතිභක්තිය ආදී අංශ පිළිබඳ කරුණු විශද වේ.

සන්දේශ කාව්‍යයන්හි එන 'කුලඟනන්' යනු වංශවත් කාන්තාවන් ය. වංශවත් වූ පමණින් ඔවුහු කුලඟනන් නොවෙති. සිය පරම්පරාවෙහි උසස් බව රැකෙන අයුරින් ක්‍රියාකිරීමත් සොඳුරු ගුණයෙන් යුක්තවීමත් ඔවුන්ගෙන් අපේක්ෂා කෙරිණ. එමෙන් ම එකල සමාජයේ කුල'ඟනක් ලෙස හඳුනා ගත් කාන්තාව වංශවත් විය යුතු මෙන් ම ඇය පතිභක්තියෙන් යුක්ත අයෙකු විය යුතු බව ගිරා සන්දේශයේ එන පහත පැදියෙන් හෙළි වේ.

"නිති වැළලා ගෙන තුරු හිමියනී
එන බමරුන් දූහැ පලු පතතිනී
සිටි පිපි ලිය දක කුල'ගන මෙනී
සකි ලස නොව යව තොස වඩමිනී" (*ගිරා සන්දේශය*, පද්‍ය, 182.)

එකල සමාජයේ සිටි කුල’ඟනන් සිය සැමියන් කෙරෙහි දැඩි පතිභක්තියකින් ක්‍රියා කළ බවත් එකල සමාජය ඔවුන්ගෙන් එබන්දක් අපේක්ෂා කළ බවත් මෙමඟින් ප්‍රකට වේ. වර්ණනාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කළ ද මෙම පැදියෙන් ද එකල සමාජය කුලවත් කාන්තාවන්ගෙන් බලාපොරොත්තු වූ චරිතාංගයන්හි පිළිඹිබුවක් ධ්වනිත වේ. තත්කාලීන සමාජයේ සිටි කුල’ඟනක් තුළ තිබිය යුතු ලක්ෂණ පිළිබඳ නිශ්චිත ප්‍රතිමානයක් මුල්බැස ගෙන තිබූ බව මෙයින් පෙනී යයි.

සන්දේශ කාව්‍යවල පුර’ඟනන් පිළිබඳ වර්ණනා ද දක්වේ. පුර’ඟනන් යනුවෙන් හඳුන්වා ඇත්තේ නගරයෙහි වෙසෙන කාන්තාවන් ය. සන්දේශ කවීන් පුරයෙහි වාසය කරන කාන්තාවන් බෙහෙවින් කෙළිලොල් ජීවිතයක් ගත කළ පිරිසක් වශයෙන් දක්වා තිබේ. ඉතා සුවපහසු ජීවිතයක් ගත කළ ඔවුහු සිය රූ සපුව කෙරෙහි නිරතුරු අවධානය යොමු කර ඇත.

"ඇඳි පුර අඟන පට සළු සිරි රැපැයි නිති"(*සැළලිහිණි සන්දේශය*, පද්‍ය. 8).

ජයවර්ධනපුරය වටා වන දියවන්නා ඔය වර්ණනයට ලක් කිරීම සඳහා යොදා ගත්තේ පුර’ඟන විසින් ඇන්ද වූ පටසළුවෙහි ස්වභාවයයි. ඇය ඇඳි පටසළුව රත් නෙළුම් පෙළින් ද රන්වන් හසුන්ගේ රූපවලින් ද දික් වූ නෙරියෙන් ද ශෝභමාන විය. දියවන්නා ඔය එසේ අලංකාරවත් පටසළුවකට උපමා කළේ පුර කාන්තාවන් ඉතාමත් විචිත්‍රවත් ලෙස සැරසී සිටින බව එයින් ධ්වනිත කිරීමට ය. තව ද පුර කාන්තාවන්ගේ රූපසම්පත්තිය සිරිරාහුල හිමියන්ගේ කිවි නෙතට හසු වී ඇත්තේ පහත පරිද්දෙනි.

"සිසි වන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලුකුළ රියසක’යුරු තිසර තන
දිසි රන ලියේව් රූ සිරි යුත් මෙපුර’ඟන
ඇසි පිය හෙළන පමණින් නො වෙති දෙව’ඟන" (*එම*, පද්‍ය, 13).

සිහින් ඉඟ, පුළුල් උකුළ, හසුන් වැනි පියොවුරු සහ රන්වන් රූප සම්පත්තියෙන් අනූන වූ පුරයේ වෙසෙන කතුන් ඇසිපිය හෙළීම හැරුණු විට දෙව්ලියන් හා සරිලන රූසපුවෙන් යුක්ත බව පැවසේ (*එම*, පද්‍ය, 13). මෙම වර්ණනාවන් අතිශයෝක්තිමය ස්වභාවයක් ගන්නා නමුදු නගරයක වෙසෙන කාන්තාවන්ගේ සැබෑ ස්වරූපය ඉස්මතු නොකෙරෙන්නේ නොවේ. පුර කාන්තාවෝ නිරතුරුව සිය රූසපුව කෙරෙහිත් එය වර්ධනය කරගැනීම කෙරෙහිත් නිරන්තරයෙන් අවධානය යොමු කරති. ගැමි කතුන්ගෙන් විද්‍යමාන වන ස්වභාවිකත්වය ඉක්මවා ගිය රූප සම්පත්තියක් ඔවුන්ගෙන් දිස් වූ බව මෙයින් අවධාරණය කෙරිණ.

සැළලිහිණි සදේශයේ දී පුර’ඟනන්ගේ රූප සම්පත්තිය ඉහත දැක් වූ අයුරින් ගෙනහැරපාන විට පරෙවි සන්දේශයේ දහතුන්වැනි හා දහතරවැනි පද්‍යයන්ගෙන් ද ඇය පිළිබඳ වර්ණනා කර ඇත්තේ "පයෝධර යුග්මය යොවුන් බවේ අතිරික්ත පිණ්ඩයන් ගුලි දෙකක් ලෙසත් මේඛලාවේ සිරිසිරි හඬ ඒ බර ඔසවාගෙන සිටින ඉඟටිය හඬවා කෙඳිරිගාන්නා වූ ආකාරයක් තොල් ගසක ලාදළු ලෙසත් බබළන දත් මල් කැකුළු ලෙසත් පියොයුරු ගෙඩි සමූහයක් ලෙස පෙන්නුම් කරමින් කාමසක්ත පිරිමින්ගේ සිත් සතුටු කර

සිටින මෙපුරයේ ලලනාවෝ කල්පලතාවක් වැනි ය" (**පරෙවි සන්දේශය**, 2004: පිපි. 5,6.) යනුවෙනි. මේ හැරුණු විට ගිරා හා හංස යන සන්දේශයන්හි දී ද පුර'ගනන් පිළිබඳ මේ හා සමාන වර්ණනා දැකගත හැකි ය (**ගිරා සන්දේශය**, පද්‍ය, 58., **හංස සන්දේශය**, පද්‍ය, 19). මේ අයුරින් සන්දේශ කවීන් පුරස්ත්‍රීන්ගේ ශෝභමාන ස්වභාවය වර්ණනා කිරීමේ දී අනෙක් සිංහල කවීන්ගෙන් වෙනස් වූ මගක් ගත් බවක් නොපෙනේ. කව්සිළුමිණෙහි එන පහත සඳහන් පද්‍ය කෙරෙහි අවධානය යොමු කරන විට ඒ බව මැනවින් පැහැදිලි වේ.

"පුරකතන දඟ කළ කලහසුනහස් නැඟුමට
රිසි බඳ බඳ රිසි තමා නොසිඳු සිඳුකැන් නුබෙහි"(**කව්සිළුමිණ**, පද්‍ය, 21).

පුරස්ත්‍රීන්ගේ (සිරකරගෙන), අල්ලාගෙන සිටියා වූ (පයෝධර) දැකීමට තමන් තුළ ඇති වූ ආසාව මුදුන් පමුණුවා නොගෙන අහසෙහි හැසුරුණා වූ සිද්ධ සමූහයා ඒ කාලහංසයෝ අහසට නඟිත්වායි ප්‍රාර්ථනා කළෝය යනු එහි අර්ථයයි. දඹදෙණි යුගයේ දී රචිත කව්සිළුමිණෙහි එන මෙවැනි තොරතුරුත් සන්දේශ කාව්‍යවල පුරස්ත්‍රීන් පිළිබඳ දක්වා ඇති තොරතුරුත් සන්දනය කරන විට එම සියවස් කිහිපය තුළ දී ඔවුන් කෙරෙහි පැවති ආකල්පවල වෙනසක් නොවූ බව ප්‍රකට වන කරුණකි.

මෙසේ සන්දේශ කතුවරයන් නගරයෙහි වාසය කරන කතුන් පිළිබඳ කරනු ලබන වර්ණනාවන් අතිශයෝක්ති ස්වභාවයක් ඉසිලුව ද ඔවුන් සියලු දෙනා සතුව ම පුර'ගනන් පිළිබඳ යම් නිශ්චිත ප්‍රතිරූපයක් පැවති බව ස්ඵුට වේ. එවකට ඔවුහු පුරවරයේ විසූ කතුන් සියැසින් දැක ගැනීමෙන් අනතුරුව, එය එසේ කාව්‍යයට නඟන්නට ඇතැයි සිතිය හැකි ය. එම කවි තුළින් එවකට නගරයෙහි විසූ කාන්තාවගේ ස්වභාවය ඉස්මතු වන අතර බොහෝ කෙළිලොල් ජීවිතයකට ඔවුහු හුරු වී සිටි බව ද පසක් කර ගත හැකි ය.

ගණිකාවන් පිළිබඳ සන්දේශ කාව්‍යයන්ගෙන් ලැබෙන තොරතුරු මඟින් කෝට්ටේ අවධියේ දී ගණිකා වෘත්තිය ප්‍රචලිතව පැවති බව සනාථ වේ. අභිසරුවෝ නම් රාත්‍රී කාලයේ දී පුරුෂයන් වසන ස්ථාන කරා යන කතුන් ය. සැළලිහිණි සඳෙසෙහි සුභ නිමිති පිළිබඳ දක්වන විට දී වෙසඟනන් පිළිබඳ සඳහන් කර ඇත (**සැළලිහිණි සන්දේශය**, පද්‍ය, 23). පරෙවියාට ජයවර්ධනපුරයෙහි දී ද කෝකිලයාට යාපාපටුනෙහි දී ද අභිසරුවන් හෙවත් ගණිකාවන් නෙත ගැටෙයි (**පරෙවි සන්දේශය**, පද්‍ය, 15., **කෝකිල සන්දේශය**, පද්‍ය, 257). මේ සෑම දූතයෙකු ම දකින අභිසාරිකාවෝ වීථිවල ගමන් කර ඇත්තේ තමන් අනුන් හට පෙනෙතියි යන බියෙනි. ඒ නිසා ම ඔවුහු අඳුර ප්‍රිය කළහ. මෙයින් පෙනී යන්නේ අභිසාරිකාවන් තම කාර්යය අන් අයගෙන් සඟවා ගන්නට උත්සාහ දැරූ බවකි.

සිය දූතයාට ගමන් මඟ පැවසීමේ දී සන්දේශ කවීන් ගැමියන් හඳුන්වා දීමට අමතක කර නොමැත. ඔවුන් ඉතා රූප සම්පත්තියෙන් යුක්ත, සරාගී පැවැත්මෙන් මත්මත් වූවන් ලෙසින් තොරතුරු දක්වා තිබේ. පොදුවේ සන්දේශ කවීන් කතුන් බෙහෙවින් සරාගී, රූප සම්පත්තියෙන් අනූන අය ලෙස නිරතුරුව දැක ඇති නිසා ගැමි කතුන් සම්බන්ධයෙන් ද සමාන කරුණු දක්වන්නට ඇතැයි සිතිය හැකි ය. එනිසා එකල සමාජයේ විසූ ගැමියන්ගේ

සැබෑ පැවැත්ම හා රූ සපුව පිළිබඳ සන්දේශ කාව්‍ය තුළින් ගම්‍ය වන්නේ නම් ඒ ඉතා විරලව පමණක් බව කිව යුතු ය. මේ නිසා ගැමිකතුන් පිළිබඳ සන්දේශ කාව්‍යවලින් කරුණු ලබා ගැනීමේ දී වඩාත් සැලකිලිමත් විය යුතු ය. සිරි තිලකසිරි මහතා පෙන්වා දී ඇති ආකාරයට කෝකිලයාට පුත්තලමෙහි දී රා බී අත්පුඩි ගසමින් නටන ගැමිලියෝ හමුවේ (තිලකසිරි, 2008: පි. 249).

"ලොබඳ වඩා රාබී මත් කත් තලම
සබඳ පතුරුවා දෙන රඟ අත් තළම
සබඳ ගලා සිට තුටු කර ණෙත් තළම
නුබඳ පමා නොව වැද යන් පුත් තලම" (*කෝකිල සන්දේශය*, 2005: පි. 53, පද්‍ය. 191).

මෙම දර්ශනය කෝට්ටේ අවධියේ රචිත සන්දේශ කාව්‍යවලින් හමු නොවන්නක් වන අතර මෙසේ රා බී නටන කතුන් ද්‍රවිඩ ස්ත්‍රීන් විය හැකි බව තිලකසිරි මහතා තවදුරටත් සඳහන් කරයි (තිලකසිරි, 2008: පි. 249). මෙම පද්‍යයෙන් සැබවින් ම හෙළි වන්නේ පුත්තලම් නගරයෙහි විසූ කාන්තාවන් පිළිබඳව ය. එහෙත් තිලකසිරි මහතා ගැමිලියන් පිළිබඳ කරනු ලබන විවරණයේ දී ඔවුන් ද ගැමි කතුන් බව සඳහන් කරයි. එහෙත් පැහැදිලි ලෙසින් පුත්තලමෙහි සිටි කතුන් පුරඟනන් ලෙස විනා ගැමිලියන් ලෙස වරදවා වටහා නොගත යුතු බව පෙනී යන කරුණකි.

ඉහත පෙන්වා දී ඇති ආකාරයට සමාජයේ විවිධ තරාතිරම් නියෝජනය කළ කාන්තාවන් පිළිබඳ ඉදිරිපත් කර ඇති තොරතුරුවලට අමතරව ආර්ථික කටයුතුවලට සම්බන්ධ වී සිටි කාන්තාවන් පිළිබඳව ද සන්දේශ කාව්‍යවලින් තොරතුරු හෙළි වේ. එකල සමාජයේ කාන්තාව කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටි බවත් ගම්බඳ ප්‍රදේශවල විශේෂයෙන් වනාන්තර අසබඩ වූ කෙත්වල ඇල්ගෙවිලියන් සිටිනු දූතයන් දැක ඇති බව සන්දේශ කාව්‍යවල සඳහනි.

"සලා දුලා පියොවුරු තඹර රොන් රත
පුලා නිලා උපුලන් ලාගෙන කනත
කලා පිලා නොව ඇල්ගෙවි කෙළින ඉත
බලා පලා යව අස්වන් ගුරුළු කෙත" (*සැළලිහිණි සන්දේශය*, පද්‍ය. 38).

ඉතා විචිත්‍රවත් ආකාරයෙන් සැරසුණු මේ ඇල්ගෙවිලියන් සමාදනයෙන් යුතුව කෙත්වතු ආරක්ෂා කිරීමෙහි නිරත වන බව එම පද්‍යයෙන් දක්වා ඇත. පරෙවියා පොතුපිටිය පසු කර ගෙන යන විට ගී ගයමින් සිටින ඇල්ගෙවිලියෝ දකියි (***පරෙවි සන්දේශය***, පද්‍ය, 62). මෙසේ කෙත්වල පමණක් නොව එද ගැමිලියන් ආර්ථික කටයුතුවල දී තමන්ට හැකි අයුරින් ආර්ථික කටයුතුවලට දායකත්වය ලබා දුන් බවත් සත්ත්ව පාලනය කෙරෙහි උනන්දු වූ බවත් ඒ කෙරෙහි දක්ෂතාවක් දක් වූ බවත් සන්දේශ කාව්‍යවලින් ලැබෙන තොරතුරු සනාථ කරයි. මොරටු එළිය සහ පොතුපිටිය යන ගම් දෙක කෝට්ටේ යුගයේ දී ගව රංචු හේතුකොටගෙන බෙහෙවින් ප්‍රසිද්ධියට පත්ව තිබුණි. ගවරංචු රැක ගැනීමට ගොපල්ලන් මෙන් ම ගොපලු කතුන් ද උත්සාහගෙන ඇත. ගිරවා මොරටු එළියේ දී ගවපල්ලන් ද දකී (***ගිරා සන්දේශය***, පද්‍ය, 56). එහෙත් අනෙක් දූතයන්ට නෙත ගැටී ඇත්තේ ගොපලු ලියන් පමණි. පරෙවි සන්දේශයේ දැක්වෙන ආකාරයට පොතුපිටියේ සිටි ගොපලු කතුන් දකින්

උඩට වන සේ වස්ත්‍ර ඇඳ සිටි අතර ඒවා බෙහෙවින් අපවිත්‍ර ඒවා විය (***පරෙවි සන්දේශය***, පද්‍ය, 56).

"වසන් මුඟුරු නොපහළ දණිනු' ඩ සිටිය
මෙවන් ගොපලු අඟනන් දකු පොතුපිටිය"(*පරෙවිසන්දේශය*, පද්‍ය, 56).

පරෙවි සන්දේශයේ ඉහත පද්‍යයේ විස්තර කර ඇති ආකාරයට ගොපලු ලියන් සිය වෘත්තිය වශයෙන් ගවයන් බලා ගැනීම සිදු කර තිබේ. කෙත්වතුවල කටයුතු කළ කතුන් සමඟ සන්සන්දනය කරන විට ගොපලු කතුන් වඩා කාර්යය බහුල වූ බව පෙනේ. ඇල්ගෙවිලියන් කෙළිදෙලෙන් පසු වුව ද ගොපලු කතුන්ට එවැනි අවසරයක් නොවූ සේ ය. ඊට හේතුව ඔබ මොබ දුව පනින ගවයින් බලා ගැනීමට ඇයට සිදුවීමයි. ඒ අනුව පෙනී යන්නේ වයස් භේදයකින් තොරව එකල සමාජයේ කාන්තාව ආර්ථික කටයුතුවලට සිය දායකත්වය ලබා දුන් බවයි.

මේ හැරුණු විට නාග කන්‍යාවියන් පිළිබඳව ද සැළලිහිණි සන්දේශයේ සඳහන් වන අතර ඔවුන් සිහිල් වැලි තලා මතුපිට වාඩි වී මැණික් එබූ වීණා රැගෙන ඒවායේ තත් මනාකොට පිරිමදිමින් මිහිරි ස්වර නංවමින් බුදුගුණ ගී ගායනා කළ බවත් එය කාගේත් සිත් ගන්නා සුළු බවත් දක්වයි (***සැළලිහිණි සන්දේශය***, පද්‍ය, 45). එකල සමාජයේ විසූ කාන්තාවන් සංගීතයෙහි නියතු වූ බව මෙයින් ප්‍රකට වේ.

කෝට්ටේ යුගය තුළ කාන්තාවන්ට හිමිව තිබූ සමාජ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක් සඳහා සන්දේශ කාව්‍යයන්ගෙන් එතරම් පිටුබලයක් නොලැබෙන බව පෙනේ. කාන්තාව සමාජයේ යම් තත්ත්වයක් ඉසුලුව ද එකල පීතෘ මූලික සමාජයක් පැවතීම නිසා ඔවුන්ව ද්විතීයික සමාජයක් හිමිව තිබිණ. එච්. ටී. බස්නායක මහතා පෙන්වා දී ඇති ආකාරයට සමාජ සංවිධානයේ ප්‍රමුඛත්වය හිමි වූයේ පවුලට ය. පවුලේ ප්‍රධානියා පියා වූ අතර පියාගෙන් පසු ප්‍රධානත්වය හිමි වූයේ වැඩිමහලු පුත්‍රයාට ය. මේ නිසා ස්ත්‍රිය තරමක් අවතක්සේරුවකට ලක් වූ බව පෙනේ. සම්භාව්‍ය යුගයේ රචිත සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, කාව්‍යශේඛරය වැනි සාහිත්‍ය කෘතිවල ද ඇතැම් විට ස්ත්‍රීන් පහත් කොට සලකා තිබුණි. ස්ත්‍රිය පොදුවේ කෘෂිකාර්මික කටයුතුවල හා ගේදොර වතුපිටි ආදියෙහි කටයුතු කළ ද කියවීම, ලිවීම ආදී වශයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වූ බවට සාධක තිබේ. කෝට්ටේ යුගයේ විසූ හයවැනි පැරකුම්බා රජුගේ දෙවැනි දියණිය වූ උලකුඩය දේවිය පිළිබඳ කාව්‍යශේඛරය කරනු ලබන විස්තරයේ දී ඇය සොමි ගුණයෙන් ද කුළුණු ගුණයෙන් ද යුක්ත වූ බව දක්වයි. තෙරුවන් කෙරෙහි භක්තිමත් තැනැත්තියක වූ ඇ නෙවලා දහම අසා ඒ අනුව පවතින සියලු කලාවන් ප්‍රගුණ කළ බවත් සියලු කලාවන් දැන සිටි බවත් පෙනී යයි. සැළලිහිණි සන්දේශයේ උලකුඩය දේවිය පිළිබඳ කරනු ලබන වර්ණනාවේ දී ඕ ඥානවන්ත හා ගුණගරුක තැනැත්තියක් බව කවියා පවසයි (***කාව්‍යශේඛරය***, පද්‍ය, 14-21). එකල සමාජයේ කාන්තාවට ද අධ්‍යාපන කටයුතුවල නිරත වීමට බාධාවක් නොවූ බව මෙයින් පෙනී යයි. එමෙන් ම ඇය නුවණැත්තියක් වශයෙන් ද සලකා තිබේ. එසේ වුව ද මෙවැනි දුර්ලභ අවස්ථාවක දී හැරුණු විට කාන්තාවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ලැබෙන තොරතුරු අල්ප ය. විශේෂයෙන් සමාජයේ ප්‍රභූ ස්ථරය නියෝජනය කරන කාන්තාවන් පිළිබඳ

කරනු ලබන විස්තරවල දී හැරුණු විට සාමාන්‍ය කාන්තාවන් පිළිබඳ සඳහන් කිරීමේ දී හිතාමතා ම පාහේ ඒ කෙරෙහි අවධානය යොමු නොකර සිටීමට කටයුතු කරන්නට ඇතැයි ද සිතිය හැකි ය.

සන්දේශ කාව්‍ය තුළින් සමකාලීන ස්ත්‍රියගේ ඇඳුම් පිළිබඳව ද යම් යම් තොරතුරු ලැබෙන අතර බොහෝ විට සමාජ ස්ථරායනය අනුව එය තීරණය වන්නට ඇතැයි සිතිය හැකි ය. කුල'ගනන් උඩුකය වැසෙන සේ ඇඳුම් ඇඳිය යුතු විය. අභිසාරිකාවන්ගේ ඇඳුම් පැළඳුම් ඔවුන්ගේ වෘත්තියට ගැලපෙන අයුරින් හා පිරිමින්ගේ සිත් මනබඳින අයුරින් සකස් විය. එහෙත් ගොපලු ලියන් දණහිසෙන් උඩට කිලිටි වස්ත්‍ර ඇඳ සිටි බව දක්වයි. මෙයින් කාන්තාවගේ සමාජ තත්ත්වය පිළිඹිබු කිරීමක් ද සන්දේශ කවියාගෙන් සිදුවන්නට ඇති බව ගම්‍ය වේ.

## *නිගමනය*

ඉහත සාකච්ඡා කර ඇති ආකාරයට කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යවලින් එකල සමාජයේ විසූ කාන්තාවන්ගේ සමාජ තත්ත්වයෙහි පැතිකඩ කිහිපයක් නිරූපනය කිරීමක් එම යුගයේ රචිත සන්දේශ කාව්‍යවලින් සිදුව ඇති බව පෙනී යන අතර එමඟින් පරිපූර්ණ වූ තොරතුරු සමුදයක් ලබා ගැනීමට අසීරු බව ද කිව යුතු ය. විශේෂයෙන් සන්දේශ කාව්‍ය තුළින් බොහෝ විට වර්ණනාත්මක කාව්‍යමය හා අතිශයෝක්ති සහිත කරුණු ඉදිරිපත් කිරීම ඊට මූලික හේතුවයි. සන්දේශ කවියාගේ මූලික අභිමතාර්ථය වූයේ එවකට උද්ගතව පැවති යම් අවශ්‍යතාවයක් සපුරා දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලා සිටීමකි. එම ඉල්ලීම සහිත හසුන දූතයෙකු අත යැවූ අතර එම දූතයාට අතරමඟ දී හමු වන ස්වභාව සෞන්දර්‍යය ස්ථාන හා පුද්ගලයන් පිළිබඳ යම් යම් වර්ණනා ඉදිරිපත් කර තිබේ. එසේ ඉදිරිපත් කිරීමේ දී කාන්තාවන් පිළිබඳ තතු ගෙනහැර දක්වීමට ද සන්දේශ කතුවරුන් උත්සුක වූ අතර බොහෝ විට ඇයගේ රූපශ්‍රීය වර්ණනා කිරීම ඔවුන්ගේ ප්‍රධාන අභිලාෂය වී ඇත. තත්කාලීන සමාජයේ විසූ කාන්තාවන්ගේ සැබෑ තතු එපරිද්දෙන් ම ඉදිරිපත් නොකළ නමුත් කවියාගේ යටිහඬට කන් දෙන විට සහ එම පද්‍ය පරීක්ෂාවෙන් අධ්‍යයනය කරන විට එකල විසූ කාන්තාව පිළිබඳ ඓතිහාසික වශයෙන් වැදගත් වන තොරතුරු ලැබෙන බව මෙහි දී කිව යුතු ය. එසේ වුව ද කාන්තාවගේ කුල ක්‍රමය, ආවාහ-විවාහ ක්‍රමය, ඉඩම් භුක්තිය, අධ්‍යාපනය වැනි විවිධ අංශ පිළිබඳ සන්දේශ කාව්‍යයන්ගෙන් තොරතුරු නොලැබෙන නමුත් ස්ත්‍රී සංස්ථාව තුළ සිටි විවිධ තරාතිරම්වලට අයත් කතුන් පිළිබඳව ද ඔවුන්ගේ හැසිරීම් ලක්ෂණ පිළිබඳව ද ආර්ථික කටයුතුවල දී කාන්තාවගේ දායකත්වය පිළිබඳව ද සන්දේශ කාව්‍යවලින් හෙළි වන තොරතුරු ඉතා වැදගත් බව සඳහන් කළ හැකි ය. එමෙන් ම මුඛ්‍ය අභිමතාර්ථය සහ යුගයේ අවශ්‍යතාව අනුව මූලාශ්‍රයන්ගෙන් ලබා දෙන තොරතුරු විවිධ ස්වරූප ගන්නා බැවින් කෝට්ටේ අවධියේ රචිත සන්දේශ තුළින් එම අවධියේ විසූ කාන්තාවන්ට හිමි වූ සමාජ තත්ත්වය පිළිබඳ ඓතිහාසික වශයෙන් වැදගත් වන තොරතුරු ලබා දෙන බව සඳහන් කළ යුතුව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය


කව්සිළුමිණ හෙවත් කුසදාවත, (1965), (සංස්.) ඇම්. බී. ආරියපාල, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාව්‍යශේඛරය, (2006), සංස්. සුචරිත ගම්ලත් සහ වෙගිරියේ කීරාල, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

කෝකිල සන්දේශය, (2005), (සංස්.) අබයරත්න වීරසිංහ, කොළඹ, විජය මුද්‍රණාලය.

ගිරා සන්දේශය, (1987), (සංස්.) කේ. ජී. ප්‍රේමරත්න, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.

පරෙවි සන්දේශය, (2004), (සංස්.) අබයරත්න වීරසිංහ, කොළඹ, විජය මුද්‍රණාලය.

සැවුල් සන්දේශය, (2005), (සංස්.) අබයරත්න වීරසිංහ, කොළඹ, විජය මුද්‍රණාලය.

සැළලිහිණි සන්දේශය, (1995,) (සංස්.) නන්දසේන රත්නපාල, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සැළලිහිණි සන්දේශය පුරාණ සන්නස සහ අර්ථ ප්‍රදීපිකා, 1999, සංස්. බන්දුසේන ගුණසේකර, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.

සිදත් සඟරා පුරාණ සන්නය, (1971), (සංස්.) කෝදාගොඩ ඥානලෝක ස්ථවිර, වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ.

සියබස්ලකර විවරණය, (2002), (සංස්.) ලේල්වල ශ්‍රී සද්ධර්මාචාර්ය සිරිනිවාස ස්ථවිර ඇතුළු පිරිස, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

හංස සන්දේශය, (2009), (සංස්.) ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි, කතෘ ප්‍රකාශන.

හංස සන්දේශය, (1991), (සංස්.) කේ. සී. පී. වික්‍රමසිංහ, කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ගුණසේකර, බන්දුසේන. (2010), සාහිත්‍ය ඉතිහාසය (කෝට්ටේ- සීතාවක- මහනුවර- මාතර) කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

තිලකසිරි, සිරි. (2008), සිංහල සන්දේශ කාව්‍යයේ සමාජ පසුබිම, කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිසේන විතානගේ, (2001), (සංස්.) සන්දේශ විවරණය, කොළඹ, සමයවර්ධන මුද්‍රණාලය

සිංහල විශ්වකෝෂය, (1994), (සංස්.) කේ. එන්. ඕ. ධර්මදාස, කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

*Kavsilumina, the Crown Jewel of Sinhala Poetry in English Prose, (2004). Trans. M. B. Ariyapala, Colombo, Godage International Publishers (pvt) Ltd.*

ගිරා හා කෝකිල යන සන්දේශ කාව්‍ය පහ මෙම යුගයේ රචනා වූ ඒවා ය. හංස සන්දේශය වීදගම හිමියන් විසින් රචනා කර ඇති අතර එය ජයවර්ධනපුරයේ සිට කැරගල පද්මාවතී පිරිවෙන්පති මාහිමියන් වෙත යැවුණකි. සමන්, බොක්සැල්, උපුල්වන්, විභීෂණ ආදී බෞද්ධ දෙවිවරුන්ට පින් දී එම දෙවිවරුන්ගේ ආශිර්වාදය සවෙනි සිරිපැරකුම් රජුට ලබා දෙන මෙන් දෙවියන්ට නියෝග කරන ලෙස පද්මාවතී පිරිවෙන්පති වනරතන මාහිමියන්ගෙන් ඉල්ලා යැවීම මෙහි පරමාර්ථයයි. (ගුණසේකර, 2010: පි. 92.) පරෙවි සන්දේශය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ පළමු කෘතියයි. එහි පරමාර්ථය වූයේ සිරිපැරකුම් රජුගේ වැඩිමහල් දියණිය වූ චන්ද්‍රවතී කුමරියට සුදුසු සැමියෙකු හා අනාගතයෙහි රට රැකිය හැකි පුතෙකු ලබා දෙන ලෙස දෙවිනුවර උපුල්වන් දෙවියන්ගෙන් ඉල්ලා සිටීමයි. (එම, පි. 57.) සැළලිහිණි සන්දේශය ද රාහුල හිමියන්ගේ කෘතියක් වන අතර සිරිපැරකුම් රජුගේ දෙවූ දියණිය වූ උලකුඩය දේවියට පුත්‍රයෙකු ලබා දෙන ලෙස ඉල්ලා කැළණියේ විභීෂණ දෙවියන් වෙත යැවෙන හසුනක් මෙහි දක්වේ. (එම, පිපි. 66,67.) ගිරා සන්දේශයේ කර්තෘ අඥාත නමුදු එහි පරමාර්ථය වී ඇත්තේ තොටගමු විජයබා පිරිවෙන් විහාරාධිපති නාථ දෙවියන්ගේ ආරක්‍ෂාව හා ආශිර්වාදය පැරකුම් නිරිඳුටත් ලක් බුදුසසුනටත් ලබාදෙන මෙන් රාහුල හිමියන්ගෙන් ඉල්ලා යැවීමයි. (එම, පි. 83.) කෝට්ටේ යුගයේ බිහි වූ අවසාන සන්දේශ කාව්‍ය වන කෝකිල සන්දේශ කතුවරයා දෙවිනුවර ඉරුගල් කුලයට අයත් තිලක පිරිවෙන්පතිව වැඩ සිටි හිමි නමකි. යාපා පටුනේ දී සපුමල් කුමරු ලබාගත් ජයග්‍රහණය ස්ථිර කර දෙන මෙන් දෙවිනුවර උපුල්වන් දෙවියන් හමුවේ පිරිත් ගායනා කොට එම දෙවියන්ගෙන් සෙත් ප්‍රාර්ථනා සපුමල් කුමරුට දන්වා යැවීම මෙම සන්දේශය රචනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වී තිබේ. (එම, පි. 76.)

මේ ආකාරයට කෝට්ටේ යුගයේ දී විවිධ පරමාර්ථ මූලික කර ගනිමින් විවිධ අලංකාරෝක්ති උපයෝගී කර ගනිමින් සන්දේශ කාව්‍ය රචනා වී තිබේ. මේවා කාව්‍යමය ගුණයෙන් අනූන වුව ද සමකාලීන දේශපාලන, ආර්ථික, සමාජ හා ආගමික පසුබිම් පිළිබඳ කරනු ලබන අධ්‍යයනවල දී ඉතා වැදගත් මූලාශ්‍රයක් වශයෙන් සැලකිය හැකි ය. කතුවරයාගේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂයට ලක් වූ ස්වභාව සෞන්දර්යය, පුද්ගලයින්, සතුන් වැනි දෑ පිළිබඳ වර්ණනාත්මක ස්වරූපයෙන් කරුණු ඉදිරිපත් කර තිබීම විශේෂත්වයකි. එසේ කරනු ලබන වර්ණනා තුළ ඓතිහාසික වශයෙන් වැදගත් තොරතුරු රැසක් අන්තර්ගතව පවතින බව ඒවා අනෙකුත් මූලාශ්‍ර සමඟ සන්සන්දනය කරන විට පෙනී යන කරුණකි. උක්ත සන්දේශ කාව්‍යවලින් හෙළි වන සමකාලීන කාන්තාවගේ තත්ත්වය කෙසේ ද යන්නත් ඒ පිළිබඳ අධ්‍යයනයේ දී සන්දේශ කාව්‍යවලට හිමි වන වැදගත්කම කෙබඳු ද යන්නත් පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය වේ.

## සාකච්ඡාව

සන්දේශ කර්තෘවරුන්ට ද සෙසු කවීන්ට මෙන් ම ස්ත්‍රී වර්ණනාවලින් බැහැර වීමට නොහැකි විය. පුරයක් හෝ ගමක් පිළිබඳ කරනු ලැබූ වර්ණනාවක දී ඔවුන්ගේ අවධානය බෙහෙවින් යොමු වූයේ කාන්තාවන් වෙතට ය. එහි අපේක්‍ෂාව වූයේ කාන්තාවන් පිළිබඳ සැබෑ තොරතුරු ඉදිරිපත් කිරීම නොව පුරුෂයන් අමන්දානන්දයට පත්කිරීමට තුඩු දෙන ස්ත්‍රී විලාශයෙහි චමත්කාරය විදහා දක්වීමයි. එනමුත් එම වර්ණනාවන් තුළින් වුව ද එකල ස්ත්‍රිය පිළිබඳ